**ශීර්ෂය - 279, කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**
**----------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළමතය

කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11 (1) වගන්තිය ප්‍රකාරව කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11 (2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කලමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 09 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කල එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම,විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්,වියදම්,වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38 (1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කර ගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත් ,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

### 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට මැතිවරණ කොමිෂන් සභාවෙන් ලැබිය යුතු රු.4,980,598 ක මුදල, මුදල් හා මුදල් සමාන දෑ යටතේ දක්වා නොතිබීම හේතුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා ඇති ශුද්ධ වත්කම් එම ප්‍රමාණයෙන්වැඩියෙන් දැක් වී තිබුණි. | මූල්‍ය ප්‍රකාශන 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන චක්‍රලේඛයේ උපදෙස් පරිදි පිළියෙල කල යුතු වීම. | පිළිගෙන ඇත. ඉදිරියේදී මෙවැනි අතපසුවීම් වළක්වා ගැනීමට කටයුතු කරන බව. |

### 1.6.2 ගණන්දීමේ නිලධාරී විසින් සිදුකල යුතු සහතිකවීම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳ කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපතිවෙත ඉදිරිපත් කල යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයක් සිදුකල බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුවීම. | අභ්‍යන්තර පාලනය පිළිබඳව නිකුත් කර ඇති උපදෙස් හා මාර්ගෝපදේශවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් නොකල බව. |

**1.6.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසි වල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **නීති රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| **(අ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**<br>2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛය | | | |
| (i) 3.1 ඡේදය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාහන 02 ක් සම්බන්ධයෙන් ඉන්ධන දහනය වීම පරීක්ෂා කර නොතිබීම. | අදාල චක්‍රලේඛය පරිදි කටයුතු කල යුතු වීම. | ඉන්ධන දහනය පරීක්ෂාවට ලක්කර ඇති බව හා පරීක්ෂාවක් සිදුනොකරන ලද වාහන සම්බන්ධයෙන් උපදෙස් ලබාදී ඇති බව. |
| (ii) 3.3 ඡේදය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක වාහන 32 ක් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේදී එක් එක් මාසයසඳහා රාජකාරී කරන ලද ප්‍රවාහන සේවා සටහන් වෙන් වෙන්ව පවත්වාගෙන ගොස් නොතිබුණි. | අදාල චක්‍රලේඛය පරිදි කටයුතු කල යුතු වීම. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කරන ලෙස උපදෙස් ලබාදී ඇති බව. |

**(ආ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ**

| | | | |
|---|---|---|---|
| 2012 ජනවාරි 05 දිනැති අංක 01/2012 දරන චක්‍රලේඛයේ 3.2 (iv) | ගම්පෙරලිය වැඩසටහන යටතේ යෝගමවත්ත නිවාස 45 මාර්ගය කොන්ක්‍රීට් කිරීමට වැඩිහිටි සමිතියක් සමඟරු.485,000ගිවිසුමකට එළඹ තිබුණු අතර එම සමිතිය විසින් උප කොන්ත්‍රාත් දී ව්‍යාපෘතිය ඉටුකර තිබීම. | 2012 ජනවාරි 05 දිනැති අංක 01/2012 දරන චක්‍රලේඛයේ 3.2 (iv) කටයුතු කල යුතු වීම. | දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් විමසුමේ කරුණු පිළිගෙන ඇති අතර අදාල සමිතිය අසාධු ලේඛණ ගතකළ බව. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 අග්‍රිම කළමනාකරණය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඉල්ලුම්කල අග්‍රිම ප්‍රමාණයට වඩා රු.45,957 ක සිට රු.946,676 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් අඩුවෙන් අග්‍රිම ලැබී තිබුණි. | භාණ්ඩාගාරය සමඟ සමීප සම්බන්ධතාවයකින් යුතුව අග්‍රිම කළමනාකරණය මනා ලෙස සිදුකර ගැනීමට කටයුතු කල යුතු වීම. | පිළිගෙන ඇත. |
| (ආ) අග්‍රිම ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලින් ලැබීමට නියමිත ප්‍රතිපාදන සැලකිල්ලට නොගැනීම හේතුවෙන් සැලසුම් කල හා ඉල්ලුම්කල අග්‍රිමය අතරරු.166,875 සිට රු.1,088,075 ක් වූ පරාසයක වෙනසක් නිරීක්ෂණය විය. | වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල කාර්යයන් සඳහා ප්‍රතිපාදන වර්ෂය ආරම්භයේදීම ලබාගෙන අග්‍රිම ඇස්තමේන්තු පිළියෙල කිරීමට කටයුතු කළ යුතු වීම. | පිළිගෙන ඇත. අග්‍රිම සැලසුම් කිරීමේදී වෙනත් දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශවලින් ලැබෙන පුනරාවර්තන ප්‍රමාණය පමණක් සැලැස්මට ඇතුලත් කර ඇති බව |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2019 වර්ෂයේදී වෙනත් වැය ශීර්ෂයන්ගේ ප්‍රතිපාදන මත ඉටුකරන ලද සංවර්ධන ව්‍යාපෘති සඳහා අක්මුදල් නොලැබීම හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට රු.1,003,558,854 ක මුදලක් ගෙවීමට තිබූ අතර, 2020 මැයි 28 දිනවනවිට රු.347,519,884 ක ශේෂයක් නිරවුල් කිරීමට තිබුණි. | අවශ්‍යතාවය අනුව අක්මුදල් ලබාගැනීමට කටයුතු කළ යුතු වීම. | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් අක්මුදල් ලැබෙන පරිදි නිරවුල් කිරීමට කටයුතු කර ඇති බව. |

**2.2 වියදම් කළමනාකරණය**

---------------------------

පහත නිරීක්ෂණයන්කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ----------- | ---------------------------------- |
| (අ) | වැය විෂයයන් 10 ක් සඳහා සලසා තිබූ රු.137,900,000 ක ප්‍රතිපාදනයෙන් රු.58,408,338 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. එය සලසා තිබූ ප්‍රතිපාදනයෙන් සියයට 12.54 සිට සියයට 100 දක්වා පරාසයක් ගෙන තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිසි පරිදි ඇස්තමේන්තු සකස් කල යුතු වීම. | අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවීම සීමා කිරීම, වියදම් සීමා කිරීම, භාණ්ඩාගාර ලේකම්ගේ 2019 නොවැම්බර් 20 දිනැති ලිපිය පරිදි ඉතිරි ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම, අළුත්වැඩියා ඉල්ලීම් ඉදිරිපත් නොවීම, ගිවිසුම්ගත වූ වැඩ තාවකාලිකව අත්හිටුවීම, පරිපාලන වියදම් වලින් අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවීම හා මිල ගණන් නොකැඳවීම යන හේතු දක්වා ඇති බව. |
| (ආ) | රඹුක්කන මාවනැල්ල හා යටියන්තොට යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 3 හි ප්‍රජා මූලික හරිත සමාජ ක්‍රියාකාරකම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා 2019 අගෝස්තු 27 දිනැති අංක 391 දරන පරිපූරක ප්‍රදානය යටතේ රු.4,050,000 ක ප්‍රතිපාදන කෑගල්ල දිස්ත්‍රික්කයට වෙන්කර දී තිබුණි. යටියන්තොට හා මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලින් ලබාදී තිබූ යෝජනා සංශෝධනය කර ක්‍රියාත්මක කිරීමට ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් දන්වා තිබුණද එසේ කටයුතු කර නොතිබුණි. රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉදිරිපත් | පරිපූරක ප්‍රදානය යටතේලබාදෙන ලද ප්‍රතිපාදන අදාල කාර්යය සඳහා යෙදවීමට කටයුතු කළ යුතු වීම. | ජනාධිපතිවරණය කැඳවීම හේතුවෙන් අදාල වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට කාලය ප්‍රමාණවත් නොවීම හා මැතිවරණයෙන් පසුව නිකුත් කළ චක්‍රලේඛ විධිවිධාන හා අග්‍රිම නොලැබීම මත වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබූ බව. |

කල යෝජනා පිළිගෙන ක්‍රියාත්මක කිරීම සඳහා රු.1,350,000 ක මුදලක් ලබාදී තිබුණත්, අදාල කාර්යයයෙහි නොයෙදීම හේතුවෙන් පරිපූරක ප්‍රතිපාදන සම්පූර්ණයෙන් උපයෝජනය කර නොතිබුණි.

**2.3 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම**

---------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | ----------- | ------------------ |
| (අ) | ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 1.6 ප්‍රකාරව නිලධාරියෙකු ස්ථාන මාරු කරනු ලැබූ විට නිලධාරියා මාරු වී යන දෙපාර්තමේන්තුවට අප්‍රමාදව ලියා දන්වා එම නිලධාරියාගෙන් අදාල ණය මුදල අයකර ගැනීමට කටයුතු කල යුතු වුවත්, වර්ෂ 2 කට ආසන්න කාලයක සිට ස්ථාන මාරු වී ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.93,457 ක ණය ශේෂයක් හා මාස 12 කට ආසන්න කාලයක සිට ස්ථාන මාරු වී ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.117,569 ක ණය මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 1.6 පරිදි කටයුතු කල යුතුවීම. | පිළිගෙන ඇත. ණය මුදල වාරික වශයෙන් ගෙවනු ලබන බව. |
| (ආ) | ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5 වගන්තිය හා 4.6 වගන්තිය ප්‍රකාරව රජයට අයවිය යුතු මුදල් ප්‍රධාන ණයකරුගෙන් අයකර ගත නොහැකි අවස්ථාවල එම මුදල් ඔහුගේ ඇපකරුගෙන් අයකර ගත යුතු වුවද ඒ අනුව කටයුතු නොකිරීමෙන් වැඩ තහනම් කල නිලධාරියෙකුගෙන් වසර 03 ත් වසර 05 ත් අතර කාලයක සිට රු.116,397 ක ණය ශේෂයක් අය නොවී පැවතුණි. | ආයතන සංග්‍රහයේXXIV පරිච්ඡේදයේ 4.5 වගන්තිය හා 4.6 වගන්තිය පරිදි කටයුතු කල යුතුවීම. | පිළිගෙන ඇත. එක් නිලධාරියෙකුගේ ඇපකරුගෙන් ණය වාරික අයකිරීමට කටයුතු කරන අතර ඉතිරි නිලධාරීන් දෙදෙනා වරින් වර ණය ශේෂය කොටස් වශයෙන් ගෙවනු ලබන බව |

## 2.4 තැන්පත් ශේෂයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කල් ඉකුත්වූ සියළුම තැන්පතු රාජ්‍ය ආදායමට බැරකිරීමට කටයුතු කල යුතු වුවත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාලව වර්ෂ 2 ඉක්මවූ එකතුව රු.4,927,612 ක් හා වර්ෂ 5 ට වැඩි එකතුව රු.68,459,898 ක් වූ තැන්පත් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි. | කල් ඉකුත්වූ තැන්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කල යුතුවීම. | නිරවුල් කිරීම සම්බන්ධ නිර්දේශ ලබා ගැනීම සඳහා කමිටුවක් පත් කර ඇති බව හා අක් මුදල් ලැබූ පසු ගෙවීම් සඳහා ඉදිරිපත් කර ඇති වවුචර් නිරවුල් කිරීමට කටයුතු කරන බව. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) සමාලෝචිත වර්ෂයේදී මිනිස්බල හා රැකී රක්ෂා අංශයේ ක්‍රියාකාරකම් 09 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණද එයින් ක්‍රියාත්මක කර තිබුණේ 05 ක් පමණි. මෙම ක්‍රියාකාරකම් 05 තුල වැඩසටහන් 207 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණද 184 ක් පමණක් ඉටුකිරීමෙන් වර්ෂය තුල වැඩසටහන් 23 ක් ඉටුකිරීමට නොහැකිවී තිබුණි. | සැලසුම් කරන පරිදි අදාල වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතු වීම. | 2019 වර්ෂයේ ප්‍රතිපාදන ලබාදීම ප්‍රමාණවත් නොවීම හා පවත්වන ලද වැඩසටහන් වාර්ෂික ප්‍රගති සැලැස්මට ඇතුලත්වී නොමැති අවස්ථා තිබූ බව. |
| (ආ) සමාජ සේවා අංශය-වැඩිහිටි, බුද්ධ ශාසන අංශය, ආපදා කළමනාකරණ අංශය හා කුඩා ව්‍යාපාර අංශය විසින් කාර්ය සාධනය, ක්‍රියාකාරී සැලැස්මට අනුව පිළියෙල කර නොතිබීමෙන් සතුටුදායක විගණන පරීක්ෂාවක් කිරීමට නොහැකි විය. | ක්‍රියාකාරී සැලැස්ම අනුව ප්‍රගතිය දැක්විය යුතුවීම. | ක්‍රියාකාරී සැලස්මට අනුව සැලසුම් කරන ලද ඇතැම් වැඩසටහන් සැලසුම් කල අයුරින් පැවැත්වීමට නොහැකි බව. |

## 3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2019 වර්ෂයට අදාලව ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘතියන්හි 2019 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය පිළිබඳ පරීක්ෂාවේදී යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ විශේෂ වැඩසටහන, ගම්පෙරලිය වැඩසටහන, ගම්පෙරලිය නිවාස වැඩසටහන හා රේඛීය අමාත්‍යාංශ ව්‍යාපෘති යන වැඩසටහන් 04 යටතේ රු.223,437,680 ක් වටිනාකමැති අනුමත ව්‍යාපෘති 476 කින්, රු.68,939,183 වටිනාකමැති ව්‍යාපෘති 91 ක් හෙවත් සියයට 31 ක ප්‍රමාණයක් ඉටුකර නොතිබුණි. | ඉලක්කයන් ළඟා කර ගත හැකි පරිදි සැලසුම් සකස් කල යුතු අතර, එකී ඉලක්කයන් සපුරා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වීම. | ඉටුකරන ලද ව්‍යාපෘති වලට අක්මුදල් නොලැබීම හේතුවෙන් සිදුවන ප්‍රමාදයන් නිසා කොන්ත්‍රාත්කාර සමිති ඔවුන්ගේ සාමාජික අරමුදල් යෙදවීමට පසුබට වීම හේතුකොට ගෙන ව්‍යාපෘති භාර ගැනීමේ මන්දගාමී ස්වභාවයක් නිරීක්ෂණය වන බව. |
| (ආ) | වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2019 වර්ෂයට අදාලව ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘතියන්හි 2019 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය පිළිබඳව පරීක්ෂාවේදී ගම්පෙරලිය හා ගම්පෙරලිය වේගවත් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ රු.297,000,000 ක් වටිනාකමැති අනුමත ව්‍යාපෘති 814 කින් රු.38,175,000 ක් වටිනාකමැති ව්‍යාපෘති 107 ක් ඉටුකර නොතිබුණි. ඉටු නොකරන ලද ව්‍යාපෘති තුල ඇස්තමේන්තු සකස් කර නොතිබූ ව්‍යාපෘති 40 ක්ද ඇස්තමේන්තු සකස් කර ක්‍රියාත්මක නොවූ ව්‍යාපෘති 46 ක් හා කොන්ත්‍රාත් පිරිනමා තිබූ ව්‍යාපෘති 21 ක් විය. | සැලසුම් කල පරිදි ප්‍රමාදයකින් තොරව ඉලක්කයන් සපුරා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවීම. | 2019.11.20 දිනැතිව භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කල BD/GPS/155/09/01/HA/2019 දරන ලිපිය අනුව ඒ වනවිට ගිවිසුම් අත්සන් නොකල ව්‍යාපෘති හා වැඩ ආරම්භ නොකල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම අත්හිටුවන ලෙස දන්වා තිබූ බව. |

## 3.3 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| දැරණියගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ජෙන්ෆඩ් වත්ත ජල යෝජනා ක්‍රමය සඳහා ගම්පෙරලිය ව්‍යාපෘතිය යටතේ රු.958,497 ක් වැය කර ජල මූලාශ්‍රය සංවර්ධනය වෙනුවෙන් ටැංකිය දක්වා ජල නල එළීම සිදුකර තිබුණි. මේ සඳහා වසර කිහිපයකට ඉහතදී ඉදිකර තිබූ ටැංකියක් යොදා ගැනීම හේතුවෙන් ජල මූලාශ්‍රයෙන් ටැංකිය වෙත ගලා එන ජලය ටැංකිය තුල නොරැඳී දැඩි ලෙස පිටතට කාන්දු වීමෙන් හා ජලය ලබාගැනීම සඳහා නිසි සැලසුමක් නොමැතිවීමෙන් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අරමුණ ඉටුවී නොතිබුණි. | සංවර්ධන ව්‍යාපෘති සඳහා ලබාදෙන ප්‍රතිපාදනවල අරමුණු ඉටුවන පරිදි සැලසුම් සකස් කර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතු වීම. | ජල ටැංකිය අළුත්වැඩියාව සඳහා ඇස්තමේන්තුවේ මුදල් වෙන්කර නොමැති බවත් මෙම ජල යෝජනා ක්‍රමය යටතේ බෙදා හැරෙන ජලය ප්‍රදේශවාසීන් විසින් භාවිතයට ගන්නා බව දැරණියගල ප්‍රාදේශීය සභාවේ සභාපති විසින් දන්වා ඇති බව. |

## 3.4 ව්‍යාපෘති නිමනොකර අත්හැර දැමීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ කෑගල්ල දිස්ත්‍රික්කයේ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05 ක් හරහා දේශීය අරමුදලින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද රු.49,678,521 ක් වටිනාකමැති වැඩසටහන් 11 ක් යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිතව පැවති ව්‍යාපෘති 89 ක් ගිවිසුම්ගත වුවත් ව්‍යාපෘති ඉටුනොකිරීම, ගිවිසුම් අත්සන් නොකිරීම, ප්‍රතිලාභීන් විසින් උපදෙස් හා විධිවිධාන ඉටුනොකිරීම, ප්‍රාදේශීය සභාව විසින් ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම, සිදුකරන පරීක්ෂණ අනුව ව්‍යාපෘතිය ඉටුකල නොහැකිවීම, ඇස්තමේන්තු සකස් නොකිරීම, ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම, ප්‍රමාණවත් කාලයක් නොතිබීම හා ප්‍රතිලාභියා ඉදිරිපත් නොවීම හා කාලය ඉක්මවීම යන හේතුන්මත ඉටුකිරීමට නොහැකි වී තිබුණි. | නියමිත කාල වකවානුව තුල ව්‍යාපෘති ඉටුකිරීමට හැකිවන පරිදි සැලසුම් විධිමත්ව පිළියෙල කර කාලරාමුව ඇතුලත ඉටුකිරීමට කටයුතු කල යුතුවීම. | පිළිගෙන ඇත. |

**3.5 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 කින් ජල ව්‍යාපෘති 08 ක් ඉටුකිරීම සඳහා ජාතික ජලාපවාහන මණ්ඩලයට ඊට අදාල රු.5,605,087 ක් වූ මුළු මුදලම 2018 අප්‍රේල් 20 දින සිට 2019 නොවැම්බර් 14 දින දක්වා කාලය තුල නිදහස් කර ඇති නමුත් ලංසු ප්‍රදානය නොකිරීම, ලංසු කැඳවීමේ ප්‍රමාදය හා කාණු කැපීම සිදු නොවී පැවතීම යනාදී කරුණු හේතුවෙන් එම ව්‍යාපෘතිවල කටයුතු 2020 මැයි 30 දින වනවිටත් අවසන් කර නොතිබුණි. | මුදල් නිදහස් කිරීමෙන් පසු එහි ප්‍රගතිය පිළිබඳ පසු විපරම් කර ව්‍යාපෘතිය ඉටුකර ගැනීමට කටයුතු කල යුතු වීම | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය සමඟ සාකච්ඡා කර නොපමාව ව්‍යාපෘතිවල අඩුපාඩු සකස් කර වාර්තා කරන ලෙස ප්‍රාදේශීය ලේකම්වරුන්වෙත උපදෙස් ලබා දී ඇති බව. |

**3.6 වත්කම් කළමනාකරණය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල 2014 දැයට කිරුල සංවර්ධන වැඩසටහන යටතේ ඉදිකරන ලද බුලත්කොහුපිටිය සතිපොළ සඳහා රු.9,387,887 ක මුදලක් ගෙවීම් කර තිබූ අතර, මෙය 2019 ජූනි 16 දින බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභාව වෙත භාරදී තිබුණි. නමුත් සැලසුම් කල පරිදි වැසිකිළි පද්ධතිය හා එළවළු සේදීමේ විවෘත කොටස් ඉටුනොකිරීම හේතුවෙන් 2020 මැයි 30 දිනවනවිටද සතිපොළ නිෂ්කාර්යව පැවතුණි. | සංවර්ධන ව්‍යාපෘති යටතේ ඉදිකිරීම් විධිමත් ලෙස උපයෝජනය කිරීමට පියවර ගත යුතු අතර සැලසුම් කල අයුරින් ඉදිකිරීම් සිදු කෙරේදැයි සුපරික්ෂාකාරී විය යුතු වීම. | බුලත්කොහුපිටිය සතිපොළ 2019 ජූනි 16 දින බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභාව වෙත භාරදී ඇති බැවින් මෙම විමසුම සබරගමුව පළාත් සභාව වෙත යොමුකිරීම සුදුසු බව. |

| | | | |
|---|---|---|---|
| (ආ) | බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල 2014 දැයට කිරුළ සංවර්ධන වැඩසටහන යටතේ රු.7,673,289 ක ප්‍රතිපාදන මෙහෙයවා ඉදිකරන ලද කැන්දව මාතෘ සායන මධ්‍යස්ථානය 2017 ඔක්තෝබර් 11 දින වනවිට වැඩ නිමකර භාරදී තිබියදීත් අත්‍යවශ්‍ය සාධකයක්ව පවතින ජල මූලාශ්‍ර නොතිබීම හේතුවෙන් 2020 මැයි 30 දිනවනවිටත් එය විවෘත කිරීමට නොහැකි වීමෙන් දරන ලද වියදම නිෂ්කාර්ය වී තිබුණි. | සංවර්ධන ව්‍යාපෘති ඉදිකිරීමට පෙර ශක්‍යතා අධ්‍යනයක් සිදු කල යුතු වීම හා වත්කම් උපයෝජනය කිරීමට පියවර ගත යුතු වීම. | කැන්දව මාතෘ සායන මධ්‍යස්ථානය 2017 ඔක්තෝබර් 11 වන දින වැඩ නිමකර භාර දී ඇති බැවින් සබරගමුව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත මෙම විමසුම යොමුකිරීම සුදුසු බව. |
| (ඇ) | අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දැයට කිරුල ජාතික වැඩසටහනට සමගාමීව එකතුව රු.17,579,192 ක් වූ ගිවිසුම් මුදලකට ඉදිකරන ලද කළුගල මාතෘ සායනය හා ගල්බොක්ක මාතෘ සායනය යන මධ්‍යස්ථාන 2 ක 2019 පෙබරවාරි 12 දින වනවිට සම්පූර්ණයෙන් වැඩ නිමකොට අදාල නඩත්තු ආයතනය වෙත භාරදී තිබුණි. එසේ වුවද මෙම මාතෘ සායනය පිහිටි ස්ථානයේ ජල මූලාශ්‍ර නොපැවතීමේ හේතුවෙන් 2020 මැයි මස වනවිටත් එම ගොඩනැගිලි ලබාදෙන ලද අරමුණට නොයොදවා නිෂ්කාර්යව පැවතුණි. | ජල මූලාශ්‍ර පිළිබඳ ශක්‍යතා අධ්‍යනයක් සිදු කිරීමෙන් පසුව ඉදිකිරීම් කටයුතු සිදු කල යුතු වීම,ගැබිණි මාතාවන්ට පරිශ්‍රයට පිවිසීමට පහසු වන ලෙස ස්ථානය තෝරා ගැනීම නිසි පරිදි සිදු කල යුතු වීම. | කළුගල මාතෘ සායන මධ්‍යස්ථානය 2019 පෙබරවාරි 12 දින ද, ගල්බොක්ක මාතෘ සායන මධ්‍යස්ථානය පෙබරවාරි 07 දින විධිමත් පරිදි දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත පවරා දී ඇත. ඒවායේ පිටපත් මේ සමඟ අමුණා ඇත. එහි නඩත්තු කටයුතු පිළිබඳ වගකීම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ සතු බව. |

## 3.7 රජයේ නිලධාරීන්ගේ ඇප තැබීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් රෙගුලාසි 880 සඳහන් විධිවිධාන ප්‍රකාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 ක ඇප තැබිය යුතු නිලධාරීන් 28 දෙනෙක් විසින් අදාල ඇප මුදල් තැන්පත් කර නොතිබුණි. තවද මුදල් රෙගුලාසි 881(ii) හි සඳහන් විධිවිධාන ප්‍රකාරව එලෙස ඇප තැබීමට අවශ්‍ය සිය යටත් | මුදල් රෙගුලාසි 880 හා 881(ii) ප්‍රකාරව ඇප තැබීමේ කටයුතු සිදුකල යුතු වීම. | සියළුම නිලධාරීන්ගේ ඇප මුදල් ලබා ගැනීම මේ දිනවල සිදුකරන අතර අවසන් වූ පසුව විගණනය දැනුවත් කිරීමට කටයුතු කරන බව. |

නිලධාරීන් නියමිත කාල සීමාව ඇතුළත එසේ ක්‍රියාකරන බවට අදාල ප්‍රධානීන් විසින් වග බලාගෙන නොමැති බවත් නිරීක්ෂණය විය.

### 3.8 පාඩු හා හානි

--------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් PD-2964 දරනවාහනය 2018 මැයි 28 දිනඅනතුරකටපත්ව තිබූ අතර, මුදල්රෙගුලාසි 104 (2) ප්‍රකාරවප්‍රාරම්භක වාර්තාවවසර 01 ක් හා මුදල් රෙගුලාසි 104 (4) ප්‍රකාරව පූර්ණ වාර්තාව වසර 01 මාස 05 ක් ප්‍රමාදව ඉදිරිපත් කර තිබුණි. රක්ෂණ සමාගමෙන් ප්‍රතිපූර්ණය නොකරනලද රු. 44,000 ක මුදල අළුත්වැඩියා කරන ලද ආයතනය විසින් ප්‍රතික්ෂේප කර තිබුණු අතර ඒ පිළිබඳව මුදල් රෙගුලාසි 109 ප්‍රකාරව පොතෙන් කපා හැරීමට කටයුතු කර නොතිබුණි. | හානි හා පාඩු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව කටයුතු කල යුතුවීම හා ලේඛණ නිවැරදිව යාවත්කාලීන කල යුතුවීම. | පිළිගෙන ඇත. ඉදිරියේදී නිවැරදිව කටයුතු කරන ලෙස නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇති බව. |
| (ආ) කම්මල්කරුවන්ගේ ජීවන තත්වය ඉහළ නැංවීමේ අරමුණින් ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ රු.1,005,930 ක් වටිනාකමකින් යුතු යකඩ තලන යන්ත්‍රයක් හා ඊට අදාල උපකරණ අරණායක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ඇපලාවත්ත වසම සඳහා ලබාදී තිබූ අතර, විධිමත් පරිදි භාර නොදෙන ගොඩනැගිල්ලක් තුල එම යන්ත්‍රය ස්ථාපිත කිරීම හේතුවෙන් රු.92,500 ක් වටිනාකමැති භාණ්ඩ අස්ථාන ගතවී තිබුණි. මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාර කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු වීම හා වගකිව යුතු නිලධාරීන්සම්බන්ධයෙන් ක්‍රියා මාර්ග ගත යුතුවීම. | වෙනත් අමාත්‍යාංශයකින් ලද ප්‍රතිපාදන උපයෝජනය කර ඉදිකරන ලද ගොඩනැගිල්ලක ස්ථාපනය කර තිබූ උපකරණ අස්ථාන ගතවීමක් නිසා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් හානි හා පාඩු ලේඛණයේ එය සටහන් නොකරන ලද බව . |

## 3.9 අනාර්ථික ගණුදෙනු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ගලිගමුව අරන්දර ප්‍රදේශයේ වෙළඳ කුටි සහිත වෙළඳ උද්‍යානයක් ගොඩනැගීම සඳහා (ග්‍රාම ශක්ති අවධි නගරය - 2018 ) ජනාධිපති ලේකම් කාර්යාලයෙන් රු.මිලියන 25 ක මුදලක් ලබාදී තිබුණි. පළමු අදියර යටතේ තොරණගහපිටිය ප්‍රවේශ මාර්ගයේ කාණු පද්ධතිය මාර්ගය කොන්ක්‍රීට් කිරීම හා පැති බැම් ඉදිකිරීම වෙනුවෙන් රු.1,911,146 ක මුදලක් ගෙවා තිබුණත් ඉදිකරන ලද පැතිබැම්ම කඩා වැටීමකට ලක්ව තිබුණි. තවද යෝජිත ඉඩම පවරා ගැනීමටද කටයුතු කර නොතිබුණු අතර, මෙම ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු සිදුකිරීම නවතා දැමීම හේතුවෙන් මෙතෙක් දරන ලද රු. 2,068,689 ක මුදල නිෂ්කාර්ය වියදමක් බවට පත්ව තිබුණි. | ව්‍යාපෘතියක් තෝරා ගැනීමේදී හා ක්‍රියාත්මක කිරීමේදී ඒ පිළිබඳව නිසි අධ්‍යානයක් කිරීම හා කාර්යක්ෂමව ඉටුකිරීමට කටයුතු කල යුතු වීම. | කරුණු පිළිගෙන ඇත. හානියට පත්ව ඇති කොටස් ප්‍රකෘති තත්ත්වයට පත් කරන ලෙස ප්‍රාදේශීය සභාවට දන්වා ඇති බව හා ඉදිකරන ලද මාර්ගය ග්‍රාම නිලධාරී වසම් දෙකක ගම්වාසීන් භාවිතයට ගනු ලබන බව. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ උඩුගොඩ ලේල්ලවල බෝක්කුවක් ඉදිකිරීමට ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය යටතේ රු.1,985,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. නමුත් බෝක්කුවක් වෙනුවට පාලමක් ඉදිකිරීම සඳහා මැද කොන්ක්‍රීට් තට්ටුවක් නොමැති පැති බැම් දෙකක් ඉදිකිරීම වෙනුවෙන් රු.1,945,000 ක මුදලක් ගෙවීම් කර තිබූ අතර, එම හේතුවෙන් වැය කල මුදල අනාර්ථික තත්වයකට පත්ව තිබුණි. තවද ඇස්තමේන්තු සකස් කිරීමේදී අයිතමයන් 03 ක යොදා ගන්නා ලද රේටයන් හා සම්මත රේටයන් අතර රු.33,736 වෙනස්කම් පැවතුණි. | සංවර්ධන ව්‍යාපෘති යටතේ ලබාදෙන ප්‍රතිපාදන ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කල යුතු වීම. | විගණන විමසුම සඳහා පිළිතුරු සපයා නොමැත. |

## 3.10 කළමනාකරණ දූර්වලතා

පහත නිරීක්ෂණයන් කරනුලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ජාතික ප්‍රතිපත්ති ආර්ථික කටයුතු , නැවත පදිංචිකිරීම හා පුනරුත්ථාපන උතුරු පළාත් | සංවර්ධන ව්‍යාපෘති කාර්යක්ෂමව හා | පිළිගෙන ඇත. මෙම ඉදිකිරීම්ව්‍යාපෘතියේ |

| | | | |
|---|---|---|---|
| | සංවර්ධන යෞවන කටයුතු අමාත්‍යාශයේ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත කිතුල්ගල නගර සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට 2019 වර්ෂයේදී රු.35,615,876 ක ප්‍රතිපාදන ලබාදී තිබුණි. ඒ යටතේ කිලෝමීටර් 0.8 ක දිගකින් යුත් කිතුල්ගල නගර මධ්‍යයේ මාර්ගය දෙපස පුළුල්කොට පැති කාණු ඉදිකිරීමට රු.25,698,900 ක මුදලකට ගිවිසුම්ගතව තිබුණි. මෙම කර්මාන්තය ඉටුකරගෙන යාමේදී බාහිර පාර්ශවයකින් එල්ලවූ බලපෑමක් මත 2019 නොවැම්බර් 29 දින සිට ඉදිකිරීම් කටයුතු අතරමඟ නතර කර තිබුණි. | ඵලදායීව සිදුකළ යුතුවීම හා ගැටළුකාරී අවස්ථාවලදී ඒවා විසඳීමට පිළියම් යෙදිය යුතු වීම. | කටයුතු අතරමඟ නතර කල බව ජාතික හා ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය දැනුවත් කර ඇති බව. |
| (ආ) | යතුරුපැදි ලබාගත් ක්ෂේත්‍ර නිලධාරියෙකු යතුරු පැදි හිමිනොවන තනතුරකට ස්ථාන මාරුවීම, සේවයෙන් ඉවත්වීම හා සේවය අත්හිටුවීම වැනි අවස්ථාවලදී යතුරුපැදියේ වෙළඳපල වටිනාකම ගෙවිය යුතු විය.එහෙත් කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හරහා යතුරු පැදි ලබාදුන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 2ක නිලධාරීන් 11 දෙනෙකු ගුරු සේවය සඳහා 2015 මාර්තු සිට 2016 පෙබරවාරි දක්වා කාලය තුලසේවයෙන් ඉවත්වී ගොස් තිබුණද, ඒවායේ වෙළඳපල වටිනාකම වූ රු.1,529,920 ක් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | අදාල ආයතනය වෙත දැනුම්දී අදාල නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුවීම. | 2014/2015 අයවැය යෝජනා ක්‍රමය යටතේ ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා ලබාදෙන යතුරු පැදි ලබාගෙන ඇති සංවර්ධන නිලධාරීන් දැනුවත් කර ඇති බවත් මේ පිළිබඳව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා ඇති බව. |
| (ඇ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 ක් තුල පිහිටි සබරගමුව පළාත් සභාවට අයත් අක්කර 117 රූඩ් 3 පර්චස් 1.6 ක් වූ භූමි ප්‍රමාණයකින් යුත් පාසල් ඉඩම් 74 ක් 1994 සිට 2018 වර්ෂය දක්වා අතර කාල පරාසයක් තුල වසා තිබුණි. එයින් පාසැල් 33 ක සම්පත් පමණක් වෙනත් කාර්යයන් සඳහා යොදා ගෙන තිබූ අතර ඉතිරි පාසැල් 41 කට අයත් අක්කර 52.5 රූඩ් 2 පර්චස් 36 ක ප්‍රමාණයක් ප්‍රයෝජනවත් කාර්යයකට යෙදවීමට කටයුතු කර නොතිබුණි. ඉහත වසා දැමූ පාසල් 74 තුල පවතින 2008 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වසා තිබුණු පාසල් 6 ක භුක්තිය ප්‍රාදේශීය ලේකම් වෙත භාරදීමටද කටයුතු කර නොතිබුණි. | රජයේ දේපල විධිමත් ලෙස උපයෝජනය කර ගැනීමට පියවර ගත යුතු අතර එහි ආරක්ෂාව සම්බන්ධයෙන් විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කල යුතුවීම. | අදාල ඉඩම් ප්‍රයෝජනවත් කටයුත්තකට යොදවන ලෙසත් වසා දැමූ පාසල් 06 ක භුක්තිය ප්‍රාදේශීය ලේකම්වරුන්වෙත පවරා දීමට කටයුතු කරන ලෙසත් උපදෙස් ලබාදී ඇති බව. |

## 3.11 විසඳා නොතිබුණු විගණන ඡේද

-----------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාලව විගණකාධිපති වාර්තාවට ඇතුලත්ව තිබුණු පසු විපරම් කටයුතු නිමනොවූ ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | | | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- | --- |
| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂය | | |
| වර්ෂය | ඡේද අංකය | | | |
| 2012 | 1.9 (ආ) 1 | නව දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු.294,982,342 ක මුදලකට ඉදිකිරීමට 2012 වර්ෂයේදී ගිවිසුමකට එළඹ තිබුණි. මෙම ගොඩනැගිල්ල සඳහා රු.72,119,833 ක මුදලක් වැය කර තිබුණු අතර 2013 නොවැම්බර් 10 දින ගිවිසුම අවලංගු කර තිබුණි. ඉදිකිරීම් කටයුතු අතරමඟ නතර කර තිබූ මෙම ගොඩනැගිල්ලේ ඉතිරි කටයුතු කරගෙන යාම සඳහා 2019 නොවැම්බර් 12 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයෙන් අවසරය ලබාදී තිබූ අතර ඒ අනුව රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙතරු.198,832,312 ක ඇස්තමේන්තු මුදලකට ප්‍රදානය කිරීමට තීරණය කර තිබුණද, 2020 මැයි මස වනවිටත් කිසිඳු ඉදිකිරීමක් සිදුකර නොතිබුණි. | ඉදිකිරීමේ කටයුතු කඩිනමින් සිදුකල යුතුවීම. | රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් මෙහි ඉතිරි වැඩ කටයුතු සිදුකිරීම සඳහා ගිවිසුම්ගත වීමට නියමිත බව හා ගිවිසුමේ කෙටුම්පතක් 2020 ජූනි 17 වන දින දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත එවා ඇති බව. |
| 2013 | 1.10 | කෑගල්ල, වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සිදුව තිබූ විශ්‍රාම වැටුප් වංචාවෙන් රු.16,765,760 ක මුදලක් අයකරගෙන නොතිබීම. | ආයතන සංග්‍රහයේ සඳහන් පරිදි කටයුතු සිදුකල යුතුවීම. | මේ සම්බන්ධයෙන් අදාල පාර්ශවයන්ට එරෙහිව විධිමත් විනය පරීක්ෂණ කටයුතු ආරම්භ කර ඇති බව. |
| 2014 | 3.9(ඇ) iii | මහල් දෙකකින් සමන්විත තුත්තිරිපිටිය බස් නැවතුම්පල රු.23,570,905 ක ඇස්තමේන්තුවකට ඉදිකිරීමට 2014 පෙබරවාරි 19 වන දින රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත භාරදී තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා රු.3,988,900 ක වියදමක් කර ඉදිකිරීම් කටයුතු අතරමඟ නවතා තිබුණි. මෙම ඉඩම රජයට අයත් ඉඩමක් බැවින් අරණායක ප්‍රාදේශීය සභාවට පවරා දීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම සඳහා 2013 හා 2019 වර්ෂයන්හි පළාත් ඉඩම් කොමසාරිස් වෙත දන්වා යවා තිබුණද 2020 මැයි 30 දින වන විටත් එම කාර්යය ඉටු වී නොතිබුණි. | ඉඩම ප්‍රාදේශීය සභාවට පවරා දීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම හා එම ආයතනය මඟින් ඉතිරි ඉදිකිරීම් කටයුතු සිදුකර ගැනීමට කටයුතු කළ යුතුවීම. | අරමුදල් ප්‍රතිපාදන සපයාගෙන මෙම කර්මාන්තය වැඩ නිමකර ගැනීමට අරණායක ප්‍රාදේශීය සභාව එකඟතාවය පලකර ඇත. ඒ අනුව ඉදිරි කටයුතු සිදුකිරීම සඳහා සහකාර පළාත් ඉඩම් කොමසාරිස්ගෙන් උපදෙස් ඉල්ලා ඇතත් එය ලැබී නොමැත. |

**4.** **තිරසර සංවර්ධනයඅරමුණු ළඟා කර ගැනීම**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| ජනාධිපති ලේකම් කාර්යාලයේ තිරසර සංවර්ධන අංශය මඟින් ප්‍රජාපාලිත ක්‍රමවේදයන් භාවිතයෙන් ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය පිටුදැකීමේ අරමුණින් 2017 වර්ෂයේදී ක්‍රියාත්මක කරනු ලැබූ ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය සඳහා කෑගල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 11ක ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය යටතේ පිහිටුවන ලද ජනතා සමිතිවල බැංකු ගිණුම් 43 ක් වෙනුවෙන් 2019 වර්ෂය තුලදී ලබාදී තිබූ රු.69,575,200 ක ප්‍රතිපාදන මුදලින් රු.58,145,376 ක මුදලක් එනම් මුළු මුදලින් සියයට 83.6 ක් අරමුණුගත කාර්යයට යොදවා ගැනීමකින් තොරව බැංකු ගිණුම්වල නිශ්කාර්යව පැවතුණි. | ව්‍යාපාති ක්‍රියාත්මක කිරීම සඳහා ලබාදෙන ප්‍රතිපාදන මුදල් කාර්යක්ෂමව උපයෝජනයට ලක්කල යුතු වීම | ඉදිරි කටයුතු සම්බන්ධයෙන් වන ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු ලබාගෙන ඒ පිළිබඳ ඉදිරියේදී විගණනය දැනුවත් කරන බව අදාල අමාත්‍යාංශය විසින් දන්වා ඇති බව. |

**5.** **මානව සම්පත් කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 1959 ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 1856 ක් වූයෙන් පුරප්පාඩු සංඛ්‍යාව 103 ක් වී තිබුණි. | අත්‍යවශ්‍ය කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කල යුතුවීම. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අනුමත සේවක පුරප්පාඩු පිරවීම සඳහා අදාල බලධාරියා වෙත දන්වා යවා ඇති බව. |